### පාර්ලිමේන්තුවේදී ලේ සොලවමින් සිදුවුණු 'උත්තරීතර ගැටුම'

# සිද්ධියට සම්බන්ධ මහජන නියෝජිතයන් දුන් දඬුවම ගැන උජාරුවෙන් කතා කරනවා, පක්ෂ මට්ටමෙනුත් දඬුවම් ඕනෑ

**එච්. අයි. කුමාර**

පාර්ලිමේන්තුව තුළ සිදු වූ සිද්ධියට සම්බන්ධ මහජන නියෝජිතයන් දෙදෙනාම තමන්ට ලබාදුන් දඬුවම ගැන උජාරුවෙන් කතා කරන බවත්, මේ නිසා පක්ෂ මට්ටමෙන්ද මෙවැනි ක්‍රියා සිදුකරන පුද්ගලයන්ට දඬුවම් ලබාදිය යුතු බවත් මාර්තු 12 ව්‍යාපාරය සඳහන් කරයි.




පාර්ලිමේන්තුව නියෝජනය කරන සමහර නියෝජිතයන් වගකීම් විරහිතව කටයුතු කරමින් සිටින අතර, එම තත්ත්වය පාලනය කිරීමේ වගකීම පක්ෂ නායකයන් සතු බවද එම සංවිධානයේ නියෝජිතයෝ පෙන්වා දෙති.

ඊයේ (11දා) පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී මේ බව කී එම ව්‍යාපාරයේ නියෝජිතයන් වැඩිදුරටත් සඳහන් කළේ, මෙවැනි ක්‍රියා ඉදිරියට සිදු නොවීමට සැලසුම් සකස් කිරීම පක්ෂ නායකයන් සතු කාර්යයක් බවයි.

මෙහිදී අදහස් දැක්වූ මාර්තු 12 ව්‍යාපාරයේ කැඳවුම්කාර මණ්ඩල සභික පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේ, පාර්ලිමේන්තුව යනු සමස්ත ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීම සඳහාත්, සාමකාමී සෞභාග්‍යවත් රටක් බිහි කිරීම සඳහාත් අවශ්‍ය නීතිරීති සහ ප්‍රතිපත්ති සකස් කරන ස්ථානයක් බවයි.

එහෙත් එම ස්ථානයේ ගැටුම් ඇති කරගන්නා නියෝජිතයන්ට එවැනි කටයුතු සිදුකළ හැකිද යන්න ප්‍රශ්නයක් පැන නැඟී තිබෙන බවත්, මේ නිසා මෙවැනි ගැටුම් ඇති කරගන්නා මහජන නියෝජිතයන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගතයුතු බවත් ඔහු පවසා සිටියේය.

මීට අමතරව ඉදිරි මැතිවරණවලට අපේක්ෂකයන් තෝරාගැනීමේදී තම ව්‍යාපාරය හඳුන්වා දී ඇති කරුණු සැලකිල්ලට ගන්නා ලෙසද මාර්තු 12 ව්‍යාපාරය ඉල්ලා සිටියි.